**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) - 2019**

-------------------------------------------------------------------------------------------

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ඔක්තෝබර් 21 දින එළඹි අංක 2790-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV  ව්‍යවස්ථාව සහ 2016 නොවැම්බර් 02 දින එළඹි අංක 3431 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, අභ්‍යන්තර සහ ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 07 හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ.  ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ගිණුම් කටයුතුභාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මඟින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ව්‍යාපෘතියේ පසුණය මුදලෙහි අරමුණු වනුයේ දැඩි ලෙස වකුගඩු රෝගයෙන් බලපෑමට ලක්වූ  ශ්‍රී ලංකා පළාත් 07 හි අඩු දියුණු ප්‍රදේශවල පළාත් පාලන ආයතන හා ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලයේ යටිතල පහසුකම් හා සපයන සේවා දියුණු කිරීම වේ. එම නිසා, ජල සැපයුම් පද්ධති, යටිතල පහසුකම්, මූලික සේවා සැපයීම් පිළිබඳ පළාත් පාලන ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීම අරමුණු වේ. ණය ගිවිසුම් අංක 2790 එස්ආර්අයි (එස්එෆ්) ප්‍රකාරව,  ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,940 කට සමාන එජඩො මිලියන 68.80 ක් වූ අතර ඉන් රු.මිලියන 7,670 කට සමාන එජඩො මිලියන 59 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ඉතිරි ඇස්තමේන්තුගත පිරිවැය වූ එජඩො මිලියන 19.8 ශ්‍රී ලංකා රජය දායක වීමට එකඟ වී තිබුණි. පසු ණය ගිවිසුම් අංක 3431 එස්ආර්අයි (එස්එෆ්) අනුව, මුල් ව්‍යාපෘතියේ කාර්යසාධනය පුළුල් කිරීම සඳහා 2017 වර්ෂයේදී එජඩො මිලියන 60 ක අතිරේක ණය මුදලක් ලබාගෙන තිබුණි. ශ්‍රී ලංකා රජයේ දායකය සමග ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය එජඩො මිලියන 67.8 වේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2015 ජූනි 30 වන විට නිම කිරීමට  සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ දිනය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්  විගණකගේ වගකීම යන  කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 6.1 වගන්තිය | ව්‍යාපෘති කාර්යමණ්ඩලය සඳහා එක් කෙටිකාලීන පුහුණුවක් සඳහා ඉඩදී ඇත. කෙසේවෙතත්, ව්‍යාපෘති අධ්‍යක්ෂ, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවකු විදේශ පුහුණු වැඩසටහන් එකකට වඩා සහභාගී වී තිබුණි. තවද, ව්‍යාපෘතියේ කටයුතු සිදුකිරීමට අවශ්‍ය බව යන්න මත ව්‍යාපෘති සමාලෝචන කමිටු මෙම පුහුණු නිර්දේශ කෙරේ. ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සහ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සමාලෝචන කමිටුවේ නිර්දේශ රහිතව විදේශ පුහුණු සඳහා සහභාගී තිබුණු බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ගේ අවස්ථාව අහිමිවී ඇත.<br><br>ව්‍යාපෘතියට අපේක්ෂිත අරමුණු ළඟා නොවේ. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් සමඟ අනුගත වීම අවශ්‍ය වේ. |
| 2019 මාර්තු 15 දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 6.2 වගන්තිය | තෝරාගැනීම් ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් මත පමණක් විය යුතුය. කෙසේවෙතත්, විදේශ පුහුණුව සඳහා සහභාගී වූ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය ව්‍යාපෘතියේ කටයුතු සඳහා සහභාගී නොවේ. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟා නොවේ. | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය රාජකාරිය මත තෝරාගෙන ඇති අතර අනෙකුත් කාර්ය මණ්ඩලය තෝරාගැනීම අමාත්‍යාංශය මඟින් සිදුකර ඇත. | චක්‍රලේඛ උපදෙස් සමඟ අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් මාස 02 කට වරක් පැවැත්වීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි. | ව්‍යාපෘතියේ නියාමන කටයුතු කාර්යක්ෂමව සිදු නොවීමට ඉඩ ඇත. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ උපදෙස් අනුව ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය වේ. |
| අංක පීඩ්/1/1/16/1 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛය | විදේශ පුහුණුවකින් පසු සියළුම සහභාගීවූවන් විසින් වාර්තාවක් ලබාදිය යුතුවේ. කෙසේවෙතත්, ඉහත වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ව්‍යාපෘතියට නොලැබේ. | සමහර සහභාගී වූවන් විසින් වාර්තා ලබාදී නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් සමඟ අනුගත වීම අවශ්‍ය වේ. |

## 3 භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, ව්‍යාපෘතිය පළාත් 07 ක පළාත් පාලන ආයතන 105 ක ඔවුන්ගේ යටිතල පහසුකම් අවශ්‍යතා වැඩිදියුණු කර ගැනීමට සහයෝගය දක්වා තිබුණු අතර, 2017 වර්ෂය අවසාන වන විට අදාළ පළාත් පාලන ආයතන 178 ක සංවර්ධන කටයුතු සම්පූර්ණ කර තිබුණි. තවද, අතිරේක ණය පහසුකම් යටතේ පළාත් පාලන ආයතන 29 ක ජල සම්පාදන ව්‍යාපෘති 29 ක්, ඉදිකිරීම් කටයුතු 35 සිදු කිරීමට සැලසුම් කර තිබුණු අතර, ඉන් පෙර වර්ෂය අවසානය වන විට ජල සම්පාදන ව්‍යාපෘති 04 ක් සම්පූර්ණ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ජල සම්පාදන ව්‍යාපෘති 03 ක් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති 11 ක කටයුතු සම්පූර්ණ කර තිබුණි. එම ව්‍යාපෘතිවල භෞතික කාර්යසාධනය පිළිබඳ ගැටළු පහත දැක්වේ.

| ක්‍රියාකාරකම | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | | ප්‍රමාදය මාස | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අපේක්ෂිත | අත්කර ගැනීම් | | | | |
| | % | % | | | | |
| **ජල සම්පාදන ව්‍යාපෘති** | | | | | | |
| (අ) මින්නේරිය ජල පිරිපහදුවේ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 100 | 80 | 30 | (අ) පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා යාම. | ජාතික සමාලෝචන කමිටුවේ අනුමැතිය සමඟ භෞතික ප්‍රගතිය සියයට 80 දී | ව්‍යාපෘතිය සිවිල් කටයුතු නියමිත පරිදි අවශ්‍ය ගුණාත්මක |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | (ආ) අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තු වන ප්‍රතිලාභ නොලැබීම. | තාක්ෂණික ගැටළු හේතුවෙන් අවසන් කළ අතර ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා වෙනම කොන්ත්‍රාත්තුවක් වශයෙන් ප්‍රචාරණය කර ඇත. | මට්ටමින් සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරුට බලපෑම් කිරීම අවශ්‍ය වේ. |
| (ආ) නුවර වැව ජල පිරිපහදුවේ ධාරිතාව වර්ධනය කිරීම | 77 | 55 | 03 | (අ) පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා යෑම.<br>(ආ) අපේක්ෂිත පාර්ශ්වයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබීම. | කොන්ත්‍රාත්කරුගේ ද්‍රවශීලතා ගැටළු අඩු කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | ව්‍යාපෘතිය සිවිල් කටයුතු නියමිත පරිදි අවශ්‍ය ගුණාත්මක මට්ටමින් සම්පූර්ණ කිරීමට කොන්ත්‍රාත්කරුට බලපෑම් කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) සේවාගම ඇල මාර්ග 03 ප්‍රදේශය වෙත නල මාර්ග පුළුල් කිරීම සහ සේවාගම ජල කුළුණ දක්වා ප්‍රධාන සම්ප්‍රේෂණ මාර්ග පුළුල් කිරීම. | 94 | 73 | 17 | -එම- | DI නළ ආනයනයේ ප්‍රමාදයන් | -එම- |
| (ඈ) නිකවැරටිය ජල සම්පාදන යෝජනා ක්‍රමය පුළුල් කිරීම | 85 | 75 | 17 | -එම- | -එම- | -එම- |
| **<u>සිවිල් ඉදිකිරීම කටයුතු</u>** | | | | | | |
| (ඉ) කුරුණෑගල නව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 75 | 75 | 03 | -එම- | පස් සඳහා අවසරය නොමැති වීම හේතුවෙන් ආරම්භයේදී ප්‍රමාද විය. | -එම- |
| (ඊ) නාරම්මල ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 100 | 65 | 05 | -එම- | මුදල් ප්‍රවාහයේ ගැටළු හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ අඩු කාර්යසාධනය | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (උ) පොල්ගහවෙළ නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීම | 100 | 80 | 06 | -එම- | මුදල් ප්‍රවාහයේ ගැටළු හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ අඩු කාර්යසාධනය | -එම- |
| (ඌ) කුරුසවත්ත පානීය ජල සම්පාදන ව්‍යාපෘතිය | 36 | 36 | 04 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (එ) මාතලේ ප්‍රාදේශීය සභාව සඳහා මාතෘ සහ සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථානය හා ප්‍රජාශාලාව ඉදිකිරීම. | 93 | 84 | 06 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඒ) කුරුකුත්තල මාතෘ සහ සෞඛ්‍ය ආරක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම. | 100 | 81 | 05 | -එම- | ඉදිකිරීම් භූමිය ඉතා දුෂ්කර ස්ථානයක පිහිටා ඇත. | -එම- |
| (ඔ) කදිරාන ශ්‍රවනාගාරය ඉදිකිරීම. | 85 | 65 | 06 | -එම- | පස් පිළිබඳ විමර්ශනයේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් සිදුකරන ලද වැරදීමක් හේතුවෙන් අත්තිවාරම් නැවත සැලසුම් කරන ලදි. | -එම- |
| (ඕ) මහබාගේ වෙළඳපල සමඟ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 95 | 91 | 10 | -එම- | තීන්ත ආලේපය සහ උපකරණ සවිකිරීම හැර සියළුම කටයුතු අවසන් කර තිබේ. | -එම- |

### 3.2 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අංකය | ක්‍රියාකාරකම් | ආරම්භ කළ දිනය | ප්‍රමාදය මාස | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| ------ | ---------------- | --------- | ------- | ------------- | ----------------- | ------------- |
| (අ) | කලා වැව පිරිපහදුව වැඩිදියුණු කිරිම | 2019 මාර්තු 15 | 24 | (අ) අවසන් කිරීමේ ප්‍රමාදයන් ඇතිවේ.<br>(ආ) ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවා යාම<br>ඇ) ඉලක්කගත පාර්ශවයන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | අදහස් දක්වා නොමැත. | කොන්ත්‍රාත්වල පිරිවැය ඉහළ යාමේ හැකියාව සහ අනවශ්‍යය කාලදීර්ඝ කිරීම්වලින් වැළකීම අවශ්‍ය වේ. |
| (ආ) | කැබිතිගොල්ලෑව ජල සම්පාදන යෝජනා ක්‍රමය | 2019 සැප්තැම්බර් 19 | 28 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඇ) | දඹුල්ල ග්‍රාමීය ප්‍රදේශ සහ කණ්ඩලම සඳහා ජල සම්පාදනය ක්‍රමය පුළුල් කිරීම | 2019 පෙබරවාරි 28 | 22 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඈ) | ඉනාමළුව සහ කිතුල්හිටියාව සඳහා ජල සම්පාදන පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය ඉදිකිරීම. | 2019 ජනවාරි 02 | 21 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඉ) | සීගිරිය සහ හබරණ ප්‍රදේශ සඳහා ජල සම්පාදන පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය ඉදිකිරීම. | 2019 ජනවාරි 02 | 21 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඊ) | බතලයාය සහ බෙලගන්වැව බෙදාහැරීම් ජාල සැපයීම් සහ එලීම. | 2019 ජනවාරි 17 | 21 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (උ) | බතලයාය සහ බෙලගන්වැව පිරිපහදුව ඉදිකිරීම | 2019 ජනවාරි 17 | 21 | -එම- | ලංසු ඇගයීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් | -එම- |
| (ඌ) | මදුරන්කුලිය බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 2019 ජනවාරි 27 | 21 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (එ) | කැකුනදූර උප නගරය වැඩිදියුණු කිරීම | 2019 මාර්තු 08 | 23 | -එම- | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම බලාපොරොත්තුවෙන් සිටී. | -එම- |
| (ඒ) | ආදාහනාගාරය ඉදිකිරීම | 2019 මාර්තු 01 | 23 | -එම- | අදහස් දක්වා නොමැත. | -එම- |
| (ඔ) | පොදු වෙළඳපොල ඉදිකිරීම | 2019 මාර්තු 11 | 23 | -එම- | ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. | -එම- |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------------ | ------------- | --------------------- | -------------- |
| (අ) | කොන්ත්‍රාත්කරුගෙන් රු.මිලියන 1.78 ක ද්‍රවශීලතා හානි අයකරගැනීම ගැනීමට කාර්යසාධන බැඳුම්කරය නියමිත කාලයේදී මුදල් කරගෙන නොතිබුණි. | කල්පිරීමට පෙර කාර්යසාධන බැඳුම්කරය මුදල් කර නොගැනීම හේතුවෙන් රජයට රු.මිලියන 1.78 ක අලාභයක් සිදුවේ. | කොන්ත්‍රාත්කරුට එකතුව රු.මි.1,798,776.22 ක් ව්‍යාපෘතියට ගෙවීමට සිදුවන අතර සැලසුම් සහ සුපරීක්ෂණ උපදේශකගේ අඩු ගුණාත්මක සුපරීක්ෂණය යටතේ කොන්ත්‍රාත්කරු විසින් සිදුකරන ලද අඩු ගුණාත්මක වශයෙන් සැලකිය යුතු ස්ථිර අඩුපාඩු ගණනාවක් පවතී. මෙම ස්ථිර අඩුපාඩු පමණක් අමතර පිරිවැයක් දරා නැවත කිරීම මගින් නිවැරදි කිරීමට හැක. | නොසැලකිලිමත් නිලධාරීන්ට එරෙහිව පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | උඩ පළාත ප්‍රාදේශීය සභාව ඉදිකිරීම් වල අඩුපාඩු හේතුවෙන් ජල සම්පාදන යෝජනා ක්‍රමය භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. අඩුපාඩු නිවැරදි කිරීමේ අරමුණින් රු.මිලියන 9.3 ක පිරිවැයකට එම කොන්ත්‍රාත්කරුට අමතර කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණද, එම කටයුතු මේ දක්වා අවසන් කර නොතිබුණි. | ව්‍යාපෘති නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් රජයට රු.මිලියන 9.3 ක පාඩුවක් සිදුවී තිබුණු අතර මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සම්බන්ධිත නොසැලකිලිමත් උපදේශකවරුන් සහ ව්‍යාපෘති නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ඇ) | පුරනැගුම මුල් අරමුදල් යටතේ උඩපලාත, උඩුදුම්බර සහ විල්ගමුව ප්‍රාදේශීය සභාවල ක්‍රියාත්මක කළ රු.මිලියන 282.36 පිරිවැය වූ ජල සම්පාදන යෝජනා ක්‍රම 3 ක් ඌන උපයෝජිතව පැවතුණි. එම | ව්‍යාපෘති නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් රජයට රු.මිලියන 102 ක පාඩුවක් සිදුවී තිබුණු අතර මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | සම්බන්ධිත නොසැලකිලිමත් උපදේශකවරුන් සහ ව්‍යාපෘති නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යාපෘතිවල අඩුපාඩු නිවැරදි කිරීමේ අරමුණින් අතිරේක මූල්‍යයන යටතේ රු.මිලියන 102 ක පිරිවැයකට නව කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. | | | |
| (ඇ) | ඉබ්බාගමුව ජල සම්පාදන යෝජනා ක්‍රමය ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට භාරදීමෙන් පසු ස්ථාන 04 කදී අවස්ථා 04 කදී බට පිපිරීම් සිදුවී තිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමේ වගකීම් කාලය අවසන් වූ පසු පැන නගින ඕනෑම අඩුපාඩුවකදී එය රජයට අතිරේක බරක් වේ. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන් සහ උපදේශකගේ නිලධාරීන් ඉදිරියේ 2019.11.08 දින පීඩන පරීක්ෂණය සිදුකර ඇත. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් සහතිකයක් ලබාගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | ඉබ්බාගමුව ජල සම්පාදන යෝජනා ක්‍රමයේ අඩුපාඩු නිවැරදි කිරීමෙන් පසු පීඩනය පරීක්ෂණය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නිලධාරීන් නොමැතිව සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය. | -එම- | -එම- | -එම- |
| (ඊ) | ගලේවෙල තිත්තවෙල්ගොල්ල ජල සම්පාදන පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා මිලිලීටර 110 PVC බට යොදාගැනීමට කොන්ත්‍රාත්කරුට ඉඩදී තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සඳහා යොදා ගැනීමට වැඩබිමෙහි ගබඩා කර තිබූ මිලිලීටර් 110 PVC බට 1,314 පළුදු සහ අවර්ණ බව භෞතික සත්‍යාපනයේදී නිරීක්ෂණය වූ අතර මෙම තොගයෙන් බට 186 ක් එලීමේ කටයුතු සඳහා යොදාගෙන තිබුණි. | අඩු කල් පැවැත්ම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගත නොහැකි වේ. | පළුදු වූ සහ අවර්ණ වූ PVC බට යොදා නොගත් බව උපදේශක ප්‍රකාශ කර ඇත. | පළුදු වූ බට ඉවත්කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | දකුණු පළාතේ කටයුතුවල නිරත උපදේශන ආයතනය විසින් සේවයේ යොදවන ලද විශේෂඥ තනතුරු පුරප්පාඩුව පැවතුණු අතර ව්‍යාපෘති 10 කින් ව්‍යාපෘති 07 සඳහා සංකල්පීය ඇඳීම්, විස්තරාත්මක වාස්තු විද්‍යාත්මක ඇඳීම්, විස්තරාත්මක ව්‍යුහාත්මක ඇඳීම්, විස්තරාත්මක සේවා ඇඳීම්, වැඩ සහ ද්‍රව්‍ය සඳහා පිරිවිතරයන් සකස් කිරීම, මූල්‍ය, පාරසරික සහ සමාජීය යනාදීය පිළිබඳ වාර්තා සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාදයන් සහිතව සම්පූර්ණ වේ. | ව්‍යාපෘතිය විසින් පවත්වාගත් සමීප සම්බන්ධතා මත ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ලැබී තිබුණි. | කණ්ඩායම් නායකයාට එරෙහිව පියවර ගැනීම වෙනුවට උපදේශන ආයතනයට එරෙහිව පියවර ගත යුතුය. |
| (ඌ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ (03 වගන්තිය) අනුව ගොඩනැගිලි ඉදිකිරීමට පෙර සැලැස්ම සඳහා ගොඩනැගිලි අවසරය ලබාගැනීම අවශ්‍ය වුවත්, උඩුනුවර ප්‍රාදේශීය සභාවේ ගෙලිඔය පොදු වෙළඳපොළ සහ රථගාල, සහ කුරුකුත්තල මාතෘ සහ ළමා සායන මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිකිරීම අවම අවශ්‍යතාවයන්ට සහ නගරයේ පොදු සංවර්ධන වැඩසටහන සමඟ අනුකූල නොවීමට ඉඩ ඇත. | අදහස් දක්වා නොමැත. | රීති සමඟ අනුගත විය යුතුය. |

3.4 **නිශ්කාර්ය /භාවිතයට නොගත්/ ඌන උපයෝජිත සම්පත්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) පළාත් සභා සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් ලබාදීම**

<u>**නිශ්කාර්ය වත්කම්**</u>

ඍ

| විගණන ගැටළුව | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| --------- | ------------ | ---------------------- | -------------- |
| ව්‍යාපෘතිය මගින් ප්‍රාදේශීය සභා 137 සඳහා දෘඩාංග සමඟ ඉදිරිපස කාර්යාල ලෙස හඳුන්වන තොරතුරු තාක්ෂණ විසඳුමක් ක්‍රියාත්මක කර තිබුණි. අලුතින් හඳුන්වාදුන් ඉදිරිපස කාර්යාල පද්ධතියට උපකාර පිණිස පසුපෙළ කාර්යාල පද්ධතියක් නොමැති වීම හේතුවෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. මධ්‍යම පළාතේ සහ උතුරු මැද පළාතේ පවතින පළාත් පාලන ආයතන 41 කින් ප්‍රාදේශීය සභා 17 ක් ඉහත පද්ධතිය සම්පූර්ණයෙන් භාවිතා කර නොතිබූ අතර ප්‍රාදේශීය සභා 16 ක් ඉහත පද්ධතිය ක්‍රියාත්මක නොකර විකල්ප නව මෘදුකාංග මිලදී ගෙන තිබුණු බව තවදුරටත් අනාවරණය වී තිබුණි. | පළාත් පාලන ආයතනවල තොරතුරු සම්බන්ධ පද්ධතිය අපේක්ෂිත ඉලක්ක අත්පත්කර ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ප්‍රදේශයේ ජීවත්වන මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ව්‍යාපෘතිය පද්ධතිය සංවර්ධනය කිරීමට නිලධාරීන් පෙළඹීම අවශ්‍ය වේ. | ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්ට පැවරිය යුතුය. |

**(ii)** **සිවිල් සහ ජලසම්පාදන ව්‍යාපෘති**
**<u>නිශ්කාර්ය වත්කම්</u>**

| | විගණන ගැටළු | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | ------------ | ------------- | ----------------------------- | ------------ |
| (අ) | වනාතවිල්ලුව ජල සම්පාදන පද්ධතිය | ප්‍රදේශයේ පවුල් 4,333 සඳහා ජලසම්පාදන පහසුකමේ නොමැත. | එකඟ වූ පරිදි ප්‍රාදේශීය සභාව ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන තිබුණි. | ප්‍රතිලාභීන් වෙත පහසුකම් සැපයීම සඳහා ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) | රිදීගම බහුකාර්ය ගොඩනැගිල්ල සහ බස්නැවතුම්පොළ | අපේක්ෂිත ප්‍රතිලාභ ලඟා නොවේ. | ව්‍යාපෘතිය යටතේ සියළුම ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර ප්‍රාදේශීය සභාව මහජනතාව සඳහා විවෘත කිරීමට සැලසුම් කර තිබුණි. | -එම- |
| (ඇ) | මාවතගම බස්නැවතුම් පොළ | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලඟා නොවේ. | මාවතගම ඉදිකළ බස් නැවතුම එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොමැත. | ඉදිකල ගොඩනැගිලි උපයෝජනයට පියවර ගත යුතුය. |
| (ඈ) | පොල්පිතිගම ජල සම්පාදන පද්ධතිය | ප්‍රදේශයේ පවුල් 1,700 සඳහා ජල සැපයුම් පහසුකම නොමැත. | පොල්පිතිගම යෝජනා ක්‍රමය සඳහා ජල බවුසර මිලදී ගැනීමට පියවර ගෙන තිබුණි. | අපේක්ෂිත අරමුණු අත්කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | මීගහකියුල බස්නැවතුම | පොදු මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ප්‍රවේශ මාර්ග ඉදිකිරීමට පියවර ගනිමින් පවතී. | බස්නැවතුම් පොළ භාවිතයට ගැනීමට ප්‍රවේශ මාර්ග ඉදිකිරීමට ප්‍රාදේශීය සභාවට උපකාර කිරීමට පියවර ගත යුතුය. |
| (ඊ) | බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ සතිපොළ, බහුකාර්ය ගොඩනැගිල්ල, වැසිකිලි, ජල සම්පාදන පද්ධතිය | පොදු මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රාදේශීය සභාව වෙත භාරදී ඇති අතර ප්‍රමාදයකින් තොරව කටයුතු ආරම්භ කිරීමට | අපේක්ෂිත අරමුණු සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් සංවර්ධන වැඩ භාවිතයට අවශ්‍ය පහසුකම් සැපයීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අමාත්‍යාංශය ප්‍රාදේශීය සභාව වෙත අවධානය යොමු කර තිබුණි. අපේක්ෂිත අරමුණු සඳහා මෙම ගොඩනැගිලි භාවිතා කිරීම අදාල ආයතනවල වගකීම වේ. | |
| (උ) | රත්තොට ප්‍රාදේශීය සභාවේ සතිපොළ | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොවේ. | වෙළෙන්දන් විසින් කරන ලද ඉල්ලීම් අනුව උප කුටිවලට වෙන්කිරීමට ප්‍රාදේශීය සභාව තීරණය කර තිබුණි. කුටි උප කොටස්වලට වෙන්කිරීම අවසන් කිරීමත් සමඟ සතිපොළෙහි කටයුතු ආරම්භ වේ. | අපේක්ෂිත අරමුණු සඳහා ගොඩනැගිල්ල යොදාගැනීමට පියවර ගත යුතුය. |
| (ඌ) | කිරම බස්නැවතුම් පොළ | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොවේ. | බස්නැවතුම් පොළ සඳහා ප්‍රවේශ මාර්ග 02 ක් ඉදිකිරීමට පියවර ගෙන තිබුණි. | බස්නැවතුම්පොළ භාවිතා කිරීම අවශ්‍ය පහසුකම් සැපයීමට පියවර ගත යුතුය. |
| (එ) | විල්ගමුව ආදාහනාගාරය | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොවේ. | ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රාදේශීය සභාව වෙත භාරදී ඇති අතර ප්‍රමාදයකින් තොරව කටයුතු ආරම්භ කිරීමට අමාත්‍යාංශය ප්‍රාදේශීය සභාව වෙත අවධානය යොමු කර තිබුණි. අපේක්ෂිත අරමුණු සඳහා මෙම ගොඩනැගිලි භාවිතා කිරීම අදාල ආයතනවල වගකීම වේ. | විල්ගමුව ප්‍රදේශයේ ආදාහනාගාරය ඉදිකිරීමේ අවශ්‍යතාවය හොඳින් ඇගයිය යුතු අතර ව්‍යාපෘතිය විසින් සපයන ලද අරමුදල් නාස්තිය වැළැක්විය යුතුය. |
| (ඒ) | විල්ගමුව ජලසම්පාදන යෝජනා ක්‍රමය | ප්‍රදේශයේ පවුල් 350 සඳහා ජල සැපයුම් පහසුකම් නොමැත. | නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | විශේෂඥයින්ව දැනුවත් කිරීමට පියවර ගත යුතු අතර වැරදි නිවැරදි කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | දික්ලන්ද ජල සම්පාදන යෝජනා ක්‍රමය | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා නොවේ. | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දෙන ලද උපදෙස් අනුව ජල පිරිපහදුව වෙනස් කිරීමට පියවර ගෙන ඇත. | අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් යොදාගැනීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| (ඕ) | ඉපලෝගම සනීපාරක්ෂක මධස්ථානය | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා නොවේ. | ජල සම්පාදන යෝජනා ක්‍රමය සම්පූර්ණ කිරීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබේ. | කඩිනම් පියවර ගැනීම අවශ්‍ය වේ. |

### 3.5 වැඩ ආරම්භ නොකළ ව්‍යාපෘතිවල කටයුතු

2017 අප්‍රේල්වලට පෙර පහත සඳහන් උප ව්‍යාපෘති ආරම්භ කිරීමට නියමිතව තිබුණද, 2020 ජුනි 30 දක්වා උප ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ක්‍රියාකාරකම් | ඇස්තමේන්තුගත වටිනාකම | බලපෑම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | | | |
| (අ) | තණමල්විල සහ හම්බේගමුව බෙදාහැරීම් පද්ධතිය සඳහා ජල සම්පාදන යෝජනා ක්‍රමය | 1,270 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ජල මූලාශවල හිඟකම හේතුවෙන් | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |
| (ආ) | තණමල්විල සහ හම්බේගමුව යෝජනා ක්‍රමය සඳහා ජල පිරිපහදු | 430 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ජල මූලාශ්‍රවල හිඟකම හේතුවෙන් | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |
| (ඇ) | කරුවලගස්වැව ජල සම්පාදන යෝජනා ක්‍රමය | 275 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ප්‍රදානය කිරීමට නියමිතය. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | කැබිතිගොල්ලෑව ජල සම්පාදන යෝජනා ක්‍රම තුන | 70 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | එක ව්‍යාපෘතියක් දැනටමත් ආරම්භ කර ඇත. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |
| (ඉ) | මධ්‍යම පළාතේ ගැඹුරු නල ළිං පොම්පාගාර 3 ක් ඉදිකිරීම සහ ක්ලෝරීන් මිශ්‍රකරණය | 60 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | අදහස් දක්වා නොමැත | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |
| (ඊ) | තණමල්විල සහ හම්බේගමුව යෝජනා ක්‍රමය සඳහා රඳවා ගැනීමේ ටැංකි ඉදිකිරීම. | 100 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ජල මූලාශ්‍රවල හිඟකම හේතුවෙන් | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |
| (උ) | කොටගල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම. | 50 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ජාතික සමාලෝචන කමිටුවේ උපදෙස් පරිදි ඉඩම් ගැටළු නිසා ඉවත් කර ඇත. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |
| (ඌ) | ආගරපතන ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම | 50 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ජාතික සමාලෝචන කමිටුවේ උපදෙස් පරිදි ඉඩම් ගැටළු නිසා ඉවත් කර ඇත. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (එ) | බතලයාය සහ බෙලගන්වැව ජල පිරිපහදු පුළුල් කිරීම | 389 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ප්‍රදානය කිරීමට නියමිතය. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |
| (ඒ) | පස්සර ජල සම්පාදන ව්‍යාපෘතිය | 434.71 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ගිවිසුම අත්සන් කර ඇත. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |
| (ඔ) | බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම | 50 | අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තුවන ප්‍රතිලාභ නොලැබේ. | ප්‍රදානය කිරීම සඳහා ආසියානු බැංකුවේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. | හැකි විගස උප ව්‍යාපෘති ආරම්භ කළ යුතු හෝ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් වැඩ පිළිවෙල සංශෝධනය කල යුතුය. |

**3.6 මතභේදයට තුඩුදෙන ගැටළු**

පහත සඳහන් නිරීක්ෂණයන කරනු ලැබේ.

| විගණන ගැටළුව<br>------------- | බලපෑම<br>----------- | කළමනාකරණයේ ප්‍රතිචාරය<br>------------------ | විගණකගේ නිර්දේශය<br>---------------------- |
|---|---|---|---|
| ඔස්ට්‍රේලියානු පෞද්ගලික සමාගමක් සමඟ 2018 දෙසැම්බර් 15 දින අත්සන් කරන ලද ගිවිසුම යටතේ පළාත් 07 ක ප්‍රාදේශීය සභා 07 ක් සඳහා උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. නියමු ව්‍යාපෘතියක් වශයෙන් වත්කම් කළමනාකරණ මෘදුකාංගයක් නිර්මාණය කිරීම මෙම උපව්‍යාපෘතියේ අරමුණ විය. 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන ආයතනයේ චක්‍රලේඛයේ අවශ්‍යතා පරිදි ප්‍රසම්පාදන භාවිතයක් නොමැතිව මෙම කොන්ත්‍රාත්තුව සඳහා විදේශ පෞද්ගලික සමාගම තෝරාගෙන ඇති බව නිරීක්ෂණය විය. ඉහත | ව්‍යාපෘතිය නතර කරන අවස්ථාවේදී නියමු ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම රජයේ මුදල් නාස්ති කිරීමක් වේ. | ව්‍යාපෘතියේ අවශ්‍යතාවය පරිදි කටයුතු සකස් කර ඇති අතර ප්‍රසම්පාදන දැන්වීම ආසියානු සංවර්ධන බැංකුවේ වෙබ් අඩවියේ පල කර ඇත. | ව්‍යාපෘතිය අවශ්‍ය ගුණාත්මක භාවය පවතින පරිදි කටයුතු කඩිනමින් නිම කිරීමට කොන්ත්‍රාත්කරු පෙලඹවීම අවශ්‍ය වේ. |

මෘදුකාංගයේ උපකාර කිරීම සහ නඩත්තු කිරීමේ ක්‍රමයක් ඉහත ගිවිසුමේ වගන්ති නොවූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

තවද, ශ්‍රී ලංකාවේ පළාත් පාලන අංශයේ පවතින නීති සහ අත්පොත් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොමැත. ඉහත ගිවිසුමේ වැඩ සැලැස්ම අනුව, 2019 දෙසැම්බර් 31 දිනට සැලසුම් කළ ආකාරයට ස්ථාපන කටයුතු සහ පුහුණු අත්පොත් සකස් කිරීම සහ කාර්යමණ්ඩල පුහුණු කිරීම් අවසන් කර නොතිබුණි.